www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාරාහි සංහාරය : එක්සත් ජනපද බොරු සහ ආත්ම-වංචාව

**Masscre in Samarra: US lies and self-delusion**

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2003 දෙසැම්බර් 03**

නින්දිත මාධ්‍යයන් විසින් ඇමරිකානු ජනතාව වෙත අවිවේචනාත්මකව සම්ප්‍රේෂනය කරන ලද මධ්‍යම ඉරාකයේ සමාරා නගරයේ සිදු වූ වෙඩි තබා ගැනීම පිලිබඳ එක්සත් ජනපද (එජ) මිලිටරියේ ආරම්භක වාර්තාව, අසත්‍ය ප්‍රබන්ධයක් බව තහවුරු වී ඇත. ඉරාක ප්‍රතිරෝධයට එරෙහි “ප්‍රධාන ජයග්‍රහනය” ලෙස හුවා දක්වන ලද්දේ, ඇමරිකානු හමුදාවන් අහිංසක මිනිසුන්, ගැහැනුන් හා ළමුන් මරා දමමින්, මුස්ලිම් පල්ලියක් හා ළදරු පාසලක් ඇතුලු දේපොලවලට හා ගොඩනැගිලිවලට අලාභ හානි කරමින්, ප්‍රාදේශීය ජනතාව තව දුරටත් කෝප ගන්වමින් සමාරා නගර මධ්‍යයේ ඉවබවක් නැතිව එල්ල කල වෙඩි ප්‍රහාරයක් ය.

සමාරා සිද්ධියේ විවිධ අංශයන් ගත් කල — සටන, මිලිටරි ප්‍රකාශයන්, මාධ්‍යයේ භූමිකාව — එය එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලා ගැනීමේ ක්ෂුද්‍ර පිලිබිඹුවකි.

සතුරන්ට දරුනු තුවාල සිදු කරමින් එක්සත් ජනපද හමුදා "විශාල ප්‍රහාරයක්" පරාජය කල බව ඇමරිකානු මිලිටරි ප්‍රකාශකයෝ මුල දී ප්‍රකාශ කලහ. ඉරාක ගරිල්ලාවරු 46 දෙනෙකු මරා දැමූ බව පෙන්ටගනය කියා සිටි අතර පසුව එය 54 දක්වා ඉහල නැංගේ ය.

ඉරාක සටන්කාමීන් දුසිම් ගනනක් මරා දමනු ලැබ ඇති බව කියන මිලිටරියේ ප්‍රකාශයන් පුනරුච්චාරනය කරමින් එක්සත් ජනපද මාධ්‍ය "හොඳ ප්‍රවෘත්ති" ඉදිරිපත් කලේ ය. *එඩිටර් පබ්ලිෂර්ස් ඔන්ලයින්* දෙසැම්බර් 2 දින සඳහන් කල ආකාරයට: "*නිව් යෝර්ක් ටයිම්ස්, නිව් යෝර්ක් පොස්ට්, ද බොස්ටන් ග්ලෝබ්, යූඑස්ඒ ටුඩේ, ද වොෂින්ටන් පොස්ට් නයිට් රිඩර්*, සඳුදා පලකල ඔවුන්ගේ මූලික වාර්තාවල කිසිදු සිවිල් වැසියකුගේ සාක්ෂි හෝ ඉරාක රෝහල් වාර්තා අඩංගු කර ගත්තේ නැත. 'මිලිටරි නිලධාරීන්ට අනුව' යන්න සඳහන් නො කරමින් බොහෝ දෙනා සරලව මැරුනු ගනන හා සටනේ වාර්තා පල කලහ. *ද ටයිම්ස්* පුවත් පත 'කැරලිකරුවන් හා ජීඅයිවරු අතර බිහිසුනු සටනින් ඉරාක වැසියන් 46ක් මිය යති' යන්න මුල් පිටුවේ ඉහලින්ම පල කල අතර එය පොදු සැලකිල්ල විය.”

පෙර දැකිය හැකි ලෙස ම රූපර්ට් ම(ර්)ඩොක්ගේ *නිව් යෝර්ක් පෝස්ට්* පුවත් පත වඩාත් ම දූෂිත ශීර්ෂ පාඨය පල කලාය: "ජීඅයිවරු සදාම් අන්තවාදීහු 46ක් මරා දමති."

කෙසේ වුව ද කතාව කියූ සැනින් වාෂ්ප විය. පුවත්පත්කරුවන් විසින් සිද්ධිය වූ ස්ථානයේ සිට වාර්තා කිරීම් සනාථ කලේ ගරිල්ලා සටන්කරුවන් දුසිම් ගනනක් මරා දැමීම පිලිබඳ කතා හාස්‍යජනක හා ඉරාකයේ සිටින එක්සත් ජනපද මිලිටරි පාලනය ගෙතු ප්‍රබන්ධ බව යි. සාමාන්‍ය ජනතාව 8-10ක් පමන මරා දමා ඇති — සියලුම දෙනා නැතහොත් වැඩිහරියක් සාමාන්‍ය ජනයා — බව ප්‍රදේශයේ පදිංචිකරුවෝ වාර්තාකරුවන්ට කීහ.

අඟහරුවාදා සිද්ධීන් පිලිබඳ මිලිටරි ප්‍රකාශයන් එලිදරව් වීම දිගටම සිදුවිය: ප්‍රධාන එක්සත් ජනපද මාධ්‍යයන් පවා ඇමරිකානු මිලිටරියේ ප්‍රධාන ජයග්‍රහනයක් පිලිබඳව පලල්ව පැතිරුනු සැකයන් පිලිගත් අතර සිවිල් ජනයාගේ මරන සම්බන්ධ සමහර තොරතුරු සම්පාදනය කලේ ය.

“නගරයේ ෂියයිට් මුස්ලිම් පල්ලියකට පැමිනි වන්දනාකරුවන් යැයි විශ්වාස කරන ඉරාන ජාතිකයින් දෙදෙනෙකු ද ඇතුලත් සිවිල් වැසියන් මරා දමමින් නගර මධ්‍යයේ පිහිටි සෙනඟ පිරුනු වෙලඳ පොලකට නො සැලකිලිමත්ව වෙඩි තැබීම පිලිබඳව චෝදනා කරමින්, පදිංචිකරුවෝ, කෝපයෙන් හා ශෝකයෙන් බරිතව, බ්‍රිගේඩයේ සොල්දාදුවන්ට තදින් බැන වැදුනු” බවට *සැන් ෆ්‍රැන්සිස්කෝ ක්‍රොනිකල්හි* විවියන් වෝල්ට් සමාරා රෝහලේ සිට වාර්තා කලේ ය. “ 'නගරයේ සියලුම ජනතාව අද ඉල්ලා සිටින්නේ පලිගන්න ලෙස යි' යි සමාරා ප්‍රධාන රෝහලේ හදිසි-කාමර සේවකයකු වන 50 හැවිරිදි මජීඩ් ෆඩෙල් අල්-සමරායි කීවේ ය. 'ඇමරිකානු සොල්දාදුවන් අපගේ සාමාන්‍ය වැසියන් මරා දමන අයුරින් ම ඔවුන්ට අවශ්‍ය කරන්නේ ඇමරිකානුවන් මරා දැමීම යි. මට තුවක්කුවක් දෙන්න. මාත් සටන් කරනවා.'

“තුවක්කු හරඹයේ දී සිවිල් වැසියන්ගේ ආරක්ෂාව කෙරෙහි ඇමරිකානු සොල්දාදුවන් මඳ අවධානයක් යෙදීම ගැන පදිංචිකරුවෝ චෝදනා කරති. ආරක්ෂිත වාහන ධාවනය කර ඇති බැංකු දෙකෙන් එකකට යාබද ගොඩනැගිල්ලකට එහා බේකරියක් හිමි 47 හැවිරිදි අබ්දුල් සතාර් මෙලෙස ප්‍රකාශ කලේ ය. 'තම කුඩා පුත්‍රයා ගැනීම සඳහා වීදිය දිගේ දුවන මිනිසකු මා දැක්කා. ඔහු මැද හිරවුනා. ඔහුට ඇමරිකානුවන් වෙඩි තැබුවා.'"

අනෙකුත් ප්‍රධාන පුවත් පත්වල මෙන් ම එක්සත් ජනපද රූපවාහිනියේ ද සමාරා වැසියන්ගෙන් ලබාගත් ඒ හා සමාන වාර්තා පලවිය. *ද නිව් යෝර්ක් ටයිම්ස්* පුවත් පත, නගරයේ මෘතශරීරාගාරයේ ගිලන්රථ රියදුරකු වන 52 හැවිරිදි අද්නන් සහීබ් ඩෆාර්ව උපුටා දැක්වී ය.

ඔහු මියගිය කාන්තාවක පෙන්වමින් මෙසේ කීය. "මෙම කාන්තාව රොකට් ග්‍රෙනේඩයක් විසි කරාද? ඇය සටනේ යෙදී සිටියා ද?" ඇමරිකානු හමුදා අතින් ඉරාක සිවිල් වැසියන් දෙදෙනෙකු මිය යනු දැක තිබුනු සාප්පු හිමිකරුවකු වන 47 හැවිරිදි සතාර් නසියාෆ්ව ද *ද ටයිම්ස්* පුවත් පත උපුටා දැක්වීය. "මට තුවක්කුවක් තිබුනා නම් මමත් ඇමරිකානුවන්ට ප්‍රහාර එල්ල කරනවා... ඇමරිකානුවෝ සෑම පැත්තට ම වෙඩි තබමින් සිටියා."

"සමහර සාක්ෂිකරුවන් කීවේ ඇමරිකානු හමුදා වෙත ප්‍රහාර එල්ල වුනු පසු ඔවුන් හැම දෙසටම වෙඩි තැබීම ආරම්භ කල බවයි." *නිව් යෝර්ක් නිව්ස් ඩේ* වාර්තාකරු මොහොමඩ් බාසි කීවේ ය. "වෙඩි තබා ගැනීමේ දී සිය සොහොයුරාට තුවාල සිදු වූ බව කී 43 හැවිරිදි අකිල් අල්-ජනාබි මෙසේ පැවසීය. 'ඔවුන් එක්වරම සෑම අතට ම වෙඩි තැබීම ආරම්භ කලා, ඔවුන් සිවිල් වැසියන් ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. අපි ඔවුන්ට ප්‍රහාර එල්ල කල අය නෙවෙයි. ඒත් දැන් අපිට ඕන මියගිය හා තුවාල ලැබූ අය වෙනුවෙන් පලිගන්නයි.' "

බ්‍රිතාන්‍යයේ *ගාර්ඩියන්* පුවත් පතේ වාර්තාකරුවෝ ප්‍රාදේශීය නිලධාරීන්ට කතා කල අතර එම නිලධාරීහු "ඉහල මලසිරුරු සංඛ්‍යාව ගැන ප්‍රශ්න කොට සටනට සම්බන්ධ නොවූවන්ගේ මල සිරුරු එහි තිබූ බව කීහ. 'අපි හිතන්නේ උපරිම වසයෙන් මිනිසුන් 8ක් හෝ 9ක් මිය ගිය බවයි' පැවසූ රෝහලේ හදිසි අනතුරු වාට්ටුවේ රෝගීන් ඇතුලත් කර ගැනීමේ ලිපිකරුවකු වන කාලිඩ් මොහොමඩ්, සමහර මියගිය අය කෙලින්ම නගරයේ මෘතශරීරාගාරයට ගෙන යන්නට ඇතැයි කීය.

"සැඟවී සිට කල පහරදීමට ප්‍රතිචාර වසයෙන් සිවිල් වැසියන් මරා දමමින් හා ඔවුන්ට තුවාල සිදු කරමින් ඇමරිකානු හමුදා හතර අතේ වෙඩි තැබීම ආරම්භ කල බව සමාරා පොලිස් නිලධාරී කැප්ටන් සබ්ති අවාඩ් කී ය. තවත් පොලිස් නිලධාරියකු වන අහමඩ් අල් සමරායි කීවේ '10කට ආසන්න සංඛ්‍යාවක් මරා දමනු ලැබූ අතර ඔවුන්ගෙන් සමහරක් දෙනා සටන් කිරීමට සම්බන්ධ අය නොවේ'... ශිෂ්‍යයකු වූ ජිහාඩ් හුසේන් කීවේ මග යන එන්නන් ආවරන සොයා දිවයනු තමන් දුටු බව යි. 'ඔවුන් සමස්ත වීදිය පුරා වෙඩි වරුසා එල්ල කරමින් සිටියා' යි ඔහු කී ය. 'පලමු වෙඩිල්ල තැබුවේ ඇමරිකානුවන් ද ෆෙඩයන්වරුන් ද කියා මා දන්නේ නැහැ. නමුත් අඩුම වසයෙන් එක් තරුන කාන්තාවක් වෙඩි වැදී බිම වැටෙනවා මා දුටුවා.' "

සමාරා සටනට සහභාගි වූ බව කියන එක්සත් ජනපද සොල්දාදුවෙක්, "සටන් නායකයෙක්" *සෝල්ජර්ස් ෆෝ ද ට්රුත්* වෙබ් අඩවියට ලියමින් විස්තර කලේ: "තුවාලකරුවන්ගෙන් බොහෝ දෙනා සාමාන්‍ය වැසියන් මිස වාර්තාවල දැක්වෙන ආකාරයේ අපරාධකරුවන් හෝ කැරලිකරුවන් නො වේ. සැඟවී සිට කරන ලද පහරදීම්වල දී පහර දුන් අයට පෙරලා වෙඩි තබන විට ටැංකි, යුද්ධරථ සහ සන්නද්ධ එච්යූඑම්වීර්ර්එස් රථ මගින් නිවාස, ගොඩනැගිලි හා මෝටර් රථ බිමට සමතලා කර දැම්මා."

වෙඩි තබා ගැනීමෙන් පසුව කිසිදු සටන්කාමියකුගේ සිරුරක් නොදුටු පදිංචිකරුවන් සමග *ඒජන්ස් ෆ්‍රාන්ස් ප්‍රෙස් (ඒඑෆ්පී)* පුවත් සේවයේ වාර්තාකරුවෝ කතා කලහ. ගිලන් රථ රියදුරකු වන ඇබ්ඩෙල් මොහෙයිම් මොහොමඩ් කීවේ ඔහු කිසිදු සටන්කරුවකු ප්‍රවාහනය කර නැති බව යි. "මා සිරුරු දුටුවානම් ඒවා පටවා ගන්නවා. එය ඇමරිකානුවන් කලා වගේ නො වේ. මැරුනු සංඛ්‍යාව ඇමරිකානුවන් විසින් නිවේදනය කරන ලද ප්‍රමානයට ලඟා වූවා නම් සමාරාවල වාතාවරනය සම්පූර්නයෙන් වෙනස් වනු ඇත."

ප්‍රහාරවලින් එකක් සිදු වූ ස්ථානයක සිට යාර 60ක් පමන දුරින් පිහිටා ඇති කඩයක හිමිකරු ඒඑෆ්පී පුවත් සේවයට මෙලෙස කීවේ ය. "වෙඩි තැබීමෙන් පසු මම මගේ සාප්පුවෙන් ඉවතට ගියා. තුවාල ලද්දන් හෝ මරනයට පත්වූවන් වීදිවල සිටියේ නැහැ. ඔවුන් අතුරුදහන් වුනේ කොහාට ද?"

(සමාරා ගැටුම පෙන්ටගනයට කුමන පාඩමක් උගන්වා තිබිය හැකි වුව ද එක් කරුනක් බොහෝ සිත් තුල ප්‍රමුඛව මතු විය යුතුය: එනම්, සිද්ධීන්වල ඇමරිකානු අනුවර්තනයන්ගේ ව්‍යාජ භාවය හෙලිදරව් කිරීමේ හැකියාවෙන් මාධ්‍යවේදීන් වලකාලීමේ අවශ්‍යතාව. නිල පිලිවෙත පුනරුච්චාරනය කිරීමට නො නැමෙන මාධ්‍යවේදීන් බියගැන්වීම හා නිශ්ශබ්ද කිරීම සඳහා, ඉරාකය යුද්ධය මුල දී ඒ වනවිටත් ක්‍රියාවට දමා තිබූ පිලිවෙතක් වන වාර්තාකරුවන් මරා දැමීම කරා මිලිටරිය නැවත යොමුවිය හැකිය.)

සැලකිය යුතු සාක්ෂි තිබිය දී වුව ද පෙන්ටගනයේ නිලධාරීහු අඟහරුවාදා ශ්‍රේෂ්ඨ ජයග්‍රහනයක් ගැන දිගටම කියාපාමින් තම මතයේ ඇඩිව එල්බ සිටියහ. "ඔවුන් ප්‍රහාර එල්ල කලා, ඔවුන්ව මරා දමනු ලැබුවා. මම හිතන්නෙ ඒක ඔවුන්ට උපදේශාත්මක වේවි කියලයි." ඒකාබද්ධ මාන්ඩලික ප්‍රධානීන්ගේ උප සභාපති ජෙනරාල් පීටර් පේස් බ්‍රසල්ස්හි දී වාර්තාකරුවන්ට කීවේ ය.

ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් අවධාරනය කලේ නො නවතින කැරලිකාරීත්වය පවත්වාගෙන යනු ලබන්නේ "අහිංසක මිනිසුන්, ගැහැනුන් හා ලමුන් මරා දැමීමේ අභිලාෂයැති සීමිත මිනිසුන් පිරිසක්" විසින් බව යි. රම්ස්ෆෙල්ඩ්ට අනුව ඔවුන් "වටලමින් අත් අඩංගුවට ගනිමින්, මරා දමමින් හා ප්‍රශ්න කරනු ලබමින්" පවතී. "ඔවුන් [ඉරාක විරුද්ධත්වය] වෙහෙසට පත් වී සිටින්නේ, නැවත ඒ සඳහා උත්සාහ දරන එකක් නැහැ" යි ජ්‍යෙෂ්ට මිලිටරි නිලධාරියෙක් *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයට කීවේ ය.

ලොව පුරා සෑම පුවත් සේවාවක ම පලවන සිවිල් තුවාලකරුවන් පිලිබඳව එක්සත් ජනපද බ්‍රිගේඩියර් ජනරාල් මාර්ක් කිම්ට් බැග්ඩෑඩ් පුවත් සම්මන්ත්‍රකයක දී කීවේ "වෛද්‍ය බලධාරීන්ගෙන් හෝ පොලීසියෙන් අපට එවැනි වාර්තා ලැබෙන්නේ නැහැ" යනුවෙනි.

ඉරාක සටන්කාමීන්ගේ අතුරුදහන් වූ මලකඳන් පිලිබඳ ගැටලු සහිත කරුනේ දී විලිලැජ්ජා නැති ආකාරයට හැසිරීමට ඇමරිකානු මිලිටරි නිලධාරීහු උත්සාහ දරා ඇත. කිම්ට් මාධ්‍යයන්ට කීවේ "මම සැක කරන්නේ ඒවා සතුරන් විසින් රැගෙන යනු ලැබ ඔවුන්ගේ මූලික ස්ථානවලට ම ගෙන එන්නට ඇතැයි කියා යි." එම කරුන පිලිබඳව ම විමසූ විට කර්නල්

ෆ්‍රෙඩ්රික් රුඩ්ස්හයිම් ප්‍රකාශ කලේ "ඔබ මගෙන් ඉල්ලන්නේ මල කඳන් ඉදිරිපත් කරන්න කියා ද?" යනුවෙනි. තවදුරටත් ඔහු කීවේ, "මේක හොඳ ප්‍රශ්නයක් ෆෙඩයින්වරුන් හෝ අපව කාට හරි සම්මුඛ සාකච්ඡාවකට කැඳවන්න පුලුවන්නම් ඔබට වඩා හොඳ උත්තරයක් ලැබේවි කියලයි මම හිතන්නේ."

සිරුරු ප්‍රමානය "අපට එම ස්ථානයෙන් ලැබෙන වාර්තා මත පදනම්" වන බව සමාරාහි 166 වන සන්නද්ධ බල ඇනියේ අන දෙන නිලධාරී ලුතිනන් කර්නල් රයන් ගොන්සාල්වේස් කීවේ ය. ගනිතමය සමීකරනයකින් විසඳිය යුතු වූ (අවිද්‍යාමාන මලසිරුරු පිලිබඳ) අභිරහස කර්නල් ගොන්සාල්වේස්ගේ වාර්තාවන් සමඟ තවදුරටත් දුෂ්කර විය. ඔහුට අනුව "කන්ඩායම් දෙකකට බෙදුනු සටන්කාමීන් 60 දෙනෙක් නගරයේ පිහිටි බැංකුවලට නව ඉරාක මුදල් ගෙන යන ආරක්ෂිත වාහන දෙකකට පහර දුන්හ. එක්සත් ජනපද හමුදා 46 දෙනෙකු මරා 11ක් අල්ලා ගත්තා නම් ඉතිරි වී ඇත්තේ තිදෙනෙකු පමනි." *ඒඑෆ්පී* නො මනාපයෙන් සටහන් කලේ ය.

සමාරා “සිරුරු ගනනත්” සටන පිලිබඳ එක්සත් ජනපද මිලිටරියේ සාමාන්‍ය පින්තූරයත් නිර්මානය කිරීමෙහි ලා සත්‍යය සරලව වසං කිරීමට එරෙහිව, ආත්ම වංචාව කොතරම් ප්‍රමානයක භූමිකාවක් ඉටු කලේ ද යන්න නිවැරදිව නීර්නය කල නො හැකි ය. ඇමරිකානු අනදෙන නිලධාරීන්ට නිසැකව ම හැඟී යන්නේ තම හමුදාවල චිත්ත ධෛර්යය වැඩි කිරීමේ හා තම මිලිටරි පෙරමුන පිලිබඳව බුෂ් පරිපාලනයට "හොඳ ප්‍රවෘත්ති" සැපයීමේ අවශ්‍යතාව යි.

කෙසේ වුව ද සමාරා සිදුවීම සමස්තයක් ලෙස යුද්ධයේ ස්වභාවය අනාවරනය කරන ගති ලක්ෂන අඩංගු කරගත්තා ය.

1. ඇමරිකානු වාඩිලා ගැනීමට එරෙහිව වර්ධනය වන, ඉරාක මහජනයාගේ දැවැන්ත විරුද්ධත්වය ය. එක්සත් ජනපද සොල්දාදුවන් සහ ඉරාක ජාතිකයන් යන දෙගොල්ලෝම, එක්සත් ජනපද හමුදා තමන්ට දක්නට ලැබෙන සැම දෙයකට ම වෙඩි තැබීම ආරම්භ කල විට, *නිව්ස් ඩේ* සඳහන් කරන ආකාරයට, “සමහර වැසියන් තමන්ගේ නිවාසවලට ගොස් තුවක්කු ගෙන එක්සත් ජනපද හමුදා වෙත වෙඩි තැබීම ආරම්භ කල” බවට එකඟ වෙති. “එක්තරා සාක්ෂිකරුවකු කීවේ ‘ඔවුහු විරෝධතාවලට සහභාගි නො වූ සාමාන්‍ය ජනයා වූහ’ යනුවෙනි. ‘නමුත් ඇමරිකානුවෝ තම මැෂින් තුවක්කු හා යුද ටැංකිවලින් සැම දිශාවකට ම වෙඩි තබන්නේ කෙසේ දැයි දුටු ඔවුන්ට පෙරලා පහර දීම අවශ්‍ය විය.’ ”

මෑත මාසවල තම ක්‍රියාවන් මගින් සහ විශේෂයෙන් ම ඉරිදා පෙන්නුම් කරන ලද අවිචාරවත් වෙඩි තැබීම් මගින් එක්සත් ජනපද හමුදා සමාරා ජනතාවගේ කෝපය අවුස්සා ඇත. පැරනි තන්ත්‍රය යටතේ එය හුසේන් විරෝධී මනෝගතියක තෝතැන්නකි. රටෙහි බොහෝ ප්‍රදේශවල ඒ හා සමාන ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී.

2. ඇමරිකානු හට පිරිස්වල චිත්ත ධෛර්ය පිරිහීම. ඉරාකයේ සිටින වඩවඩා අධෛර්යයට පත් වන ඇමරිකානු හමුදාවල මානසික තත්වය, බොහෝ විසංවාදී හා පරස්පර විරෝධී මනෝගතීන් අඩංගු කර ගත යුතු යඃ යුද්ධයට විරුද්ධත්වය, මංමුලාව, වික්ෂිප්තභාවය, බිය, ඉච්ඡා භංගත්වය මෙන් ම මනුෂ්‍ය ඝාතනවල ස්වරූපය ගත හැකි කෝපය.

"මම එලඹෙන දින පිලිබඳව බෙහෙවින් සැලකිල්ලෙන් සිටිමි. අපි බොහෝ සාමාන්‍ය වැසියන් මෙන් ම නීති විරෝධී ඉරාක සටන්කාමීන් මරා දමා ඇත්තෙමු. අපි බොහෝ ඉරාක වැසියන් අපට එරෙහිව හරවා ගනිමින් සිටින්නෙමු. අපි වලෙන් ගොඩට එනු වෙනුවට තවත් ගැඹුරට හාරා ගන්නේ දැයි යන්න පිලිබඳව මම බිය වෙමි." යනුවෙන් සමාරා සටන පිලිබඳව *සෝල්ජර් ෆෝ ද ට්රුත්* හි උපුටා දැක් වූ එක්සත් ජනපද හටයා ලියන විට ඔහු ඇමරිකානු හට පිරිස් අතර පොදු කනස්සල්ල පිලිබිඹු කල බවට සැකයක් නැත.

3. ඇමරිකානු පාලක කවවල තිබෙන දේශපාලනික හා මිලිටරිමය ව්‍යාකූලත්වය. ඉරාකය පිලිබඳ එක්සත් ජනපද ප්‍රතිපත්තියට තෝරා ගත හැකි මාර්ග දෙකක් ඇත. එක්කෝ බුෂ් පරිපාලනයට හා ඇමරිකානු පාලක ප්‍රභූවට සිතා ගැනීමටවත් නො හැකි මාර්ගයක් වන එරටින් ඇමරිකානු හමුදා ඉවත් කර ගැනීම, නැතහොත් ඉරාක වැසියන් දහස් ගනනක් කායිකව ඉවත් කිරීම හා රට මහා සිර කඳවුරක් බවට පරිවර්තනය කිරීම.

"ඔපරේෂන් අයන් හැමර්" දියත් කිරීම සහ සමාරාහි කල ලෙස මහ වෙඩි බලය මුදා හැරීම නිදහසට කුමන කරුනක් කියා සිටිය ද එය ඔප්පු කර සිටින්නේ, වත්මන් අසීරු තත්වයට එක්සත් ජනපද මිලිටරියේ ප්‍රතිචාරය වන්නේ ප්‍රචන්ඩත්වයේ මට්ටම වැඩි කිරීම හා වඩවඩා තියුනු වන ඉරාක විරුද්ධත්වයට සහ සමස්තයක් ලෙස ඉරාක මහජනතාවට එරෙහිව ත්‍රස්තය වැඩි දියුනු කිරීම බව ය.

4. ඇමරිකානු මාධ්‍යයේ සම්පූර්න සහයෝගය සහිතව මුසාවාදකරනයේ හා අපේක්ෂා කරන චින්තනයේ පිහිට පැතීම. සමාරාහි සටන ගැන මිලිටරියේ බොරු කීම සමස්ත ඉරාක ක්‍රියාන්විතයේ ම හදවතේ ඇති මූලික බොරු පිලිබඳ තියුනු ම ප්‍රකාශනය යි. "මහා ජන නාශක අවි" හා සදාම් හුසේන්ගේ අල් කයිඩා සබඳතා පිලිබඳ මුසා මගින් සාධාරනීකරනය කර ඇති නීති විරෝධී යුද්ධයක් වන මෙය ඉරාක ජාතිකයන් බහුතරයකගේ අභිලාෂයන්ට එරෙහිව යෝධ භූගෝලීය විරුද්ධත්වයක් මැද කරගෙන යන්නකි. ආක්‍රමනය හා අල්ලා ගැනීම පිටුපසින් සූරාකෑමේ විජිත අභිප්‍රායන් ඇති අතර ඒවා එකක් වත් බුෂ් පරිපාලනය හෝ එක්සත් ජනපද මාධ්‍ය හා රූපවාහිනිය මගින් පිලිගනු ලැබ නැත.

සමාරා සටන බුෂ් පරිපාලනය ඉරාක ජනයා, ඇමරිකානු ජනයා හා සමස්ත ලෝක ජනගහනය සඳහා සූදානම් කරමින් සිටින ව්‍යසනයක කුඩා පූර්ව අත්දැකීමකි.

© www.wsws.org